# කැලණිය විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව
## බාහිර විභාග අංශය
## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
## වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) 2009
## 2010 ඔක්තෝබර්/නොවැම්බර්

---

**BCOM E 2025 – සංවිධාන චර්යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත දැක්වෙන සිද්ධිය කියවා අවසානයේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුඩා ව්‍යාපාරයක් වන සාගර පෞද්ගලික සමාගම ප්ලාස්ටික් භාණ්ඩ වන කෝප්ප,පනිට්ටු සහ අනෙකුත් එදිනෙදා භාවිතා වන ගෘහ උපකරණ නිෂ්පාදනය කරයි. මෙම සමාගම කොළඹ ප්‍රදේශයෙහි පිහිටා ඇත. නිෂ්පාදිත ඇසුරුම් කිරිම වැනි ඉතා ස්වල්ප මෙහෙයුම් ප්‍රමාණයක් පමණක් අතින් සිදුකරනු ලබන අතර නිෂ්පාදිත අංශයෙහි 80 ක් පමණ සේවයෙහි යෙදී සිටියි. සමාගම තම නිෂ්පාදිතයන් කොළඹ ප්‍රදේශයෙහි සිටින සිල්ලර වෙළඳුන්ට සපයනු ලබයි. සමාගම සතුව දීඝී නිෂ්පාදන ක්‍රියාවලියක් සහ දීඝී නිෂ්පාදන ජීව චක්‍රයක් පවතින අතර, ඒ හේතුවෙන් සමාගම අඩු ලාභයක් ලබන්නේයැයි කළමනාකරණයේ විශ්වාසය වේ. පවුලේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ කළ " සාගර සමාගමෙහි " ඉහළ කළමනාකරණය වන සාගර පවුලෙහි සාමාජිකයන් ඉක්මන් කෙටි නිෂ්පාදන ක්‍රියාවලියක් සහ කෙටි නිෂ්පාදන ජීව චක්‍රයක් ඇති කිරීමට සම්පත් ආයෝජනය කළ යුතු බවට තීරණය කරන ලදී. ඒ සඳහා නුපුහුණු ශ්‍රමය හා අර්ධ පුහුණු ශ්‍රමය යන ප්‍රශ්න අවම කිරීම සඳහා ඇසුරුම් යන්ත්‍රයක් හඳුන්වාදීමට තීරණය කරන ලදී.

සේවක වැටුප් හා වැඩ තත්ත්වයන් සම්බන්ධ ප්‍රශ්න වලදී ඇති කාර්මික සම්බන්ධතා පිළිබඳව සමාගම සතුව ඇත්තේ අයහපත් වාර්තාවන්ය. වෘත්තිය සමිතිවල නායකයෙක් වන රංජිත් සම්බන්ධව කළමනාකරණය සතුව ඇත්තේ අයහපත් ආකල්පයකි. ඔහු පෞද්ගලික හා වෘත්තිය ආචාරධර්ම සම්බන්ධව අඩු ඇගයීමක් ඇති නමුත් සේවකයන් සමඟ කටයුතු කිරීමේදී හා දේශපාලනයට ඉතා හොඳ පුද්ගලයෙක් වේ. ඔහු සමඟ වැඩ කරන සේවකයන් ඔහු කෙරෙහි ඇති විශ්වාසීභාවය තහවුරු කරගැනීමටත්, ඔහුගේ අවවාදයන් පිළිගැන්වීමටවත් ඉහළ බලයක් ඇති පුද්ගලයෙකි. සමාගම සේවකයන් කප්පාදු කිරීමට යන්නේ නම් රංජිත්ගෙන් කිසිදු සහායක් නොලැබෙන බව කළමනාකරණය හොඳින් දැනුවත් වී සිටියි. විශාල මුදලක් ලබාගැනීමට මෙය හොඳ අවස්ථාවක් ලෙස ක්ෂණිකවම රංජිත් විසින් හඳුනාගන්නා ලදී. එසේම ඒ සම්බන්ධයෙන් ඔහුට අනෙකුත් සේවකයන් දැනුවත් කළහැකිබව ඔහුගේ විශ්වාසය වේ. ඒ සඳහා ඔහුට අවම වශයෙන් මාස 6 ක පමණක්වත් කාලය අවශ්‍ය වේ. කෙසේවුවද, නව ක්‍රමය හඳුන්වාදීමට කළමනාකරණයේ යම් දෙගිඩියාවක් පැවති අතර ඔවුන් රංජිත්ට පැවසුයේ තම තීරණය ක්‍රියාත්මක කිරීමට නම් මාස 3 ක් ඇතුලත දී සේවකයන් මෙම ප්‍රශ්නය සම්බන්ධව දැනුවත් කරන ලෙසයි. කෙසේ නමුත් රංජිත් තම කාර්‍ය ඉතා හොඳින් ඉටුකළ අතර ඔහුගේ එම ප්‍රයත්නය සඳහා ප්‍රතිලාභයක් ලෙස විශාල මුදලක් සමාගමෙන් ඉල්ලා සිටින ලදී. රංජිත් ඉල්ලුම් කරන ලද මුදල ඇසූ සාගර සහෝදරයෝ ඉතා විශ්මයට පත්විණි. කෙසේවුවද රංජිත්ගේ යෝජනාව ප්‍රතික්ෂේප කළහොත් තත්ත්වය වඩාත් අයහපත් වන බව කළමනාකරණය දැනුවත්වී තිබිණි.

ප්‍රශ්න

(අ) " සාගර සමාගමෙහි " වෙනස්කම් සඳහා සාගර පවුල හඳුන්වාදෙනු ලැබූ ක්‍රමය සුදුසු වන්නෙහිද ? සුදුසු හේතු දක්වමින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 10)

(ආ) ඔබ සාගර පවුල මුහුණ දී ඇති තත්ත්වයෙහි සිටියා නම් රංජිත් පාලනය කිරීම සඳහා කුමන ක්‍රියාමාර්ග ගනු ලබන්නෙහි ද ? හේතු දක්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

(02) (අ) සංවිධාන චර්යාව යන්න අර්ථ දක්වා කළමනාකරණයට එහි ඇති අදාලත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ආ) සංවිධාන චර්යාව සම්බන්ධ සංකල්ප භාවිතයේ දී වර්තමානයේ කළමනාකරුවන් මුහුණදෙන ප්‍රධාන ප්‍රශ්න හා අභියෝග විශ්ලේෂණය කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

(03) (අ) පෞරුෂත්වය යන්න නිර්වචනය කිරීමේදී " ආරයේ " දායකත්වය උදාහරණ ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ආ) " ව්‍යාපාර සංවිධාන වල අරමුණු ලඟාකර ගැනීමේ දී පෞරුෂත්ව " ඒ " ගති ලක්ෂණ ඇති කළමනාකරුවන් , පෞරුෂත්ව " බී " ගති ලක්ෂණ ඇති කළමනාකරුවන්ට වඩා කාර්යක්ෂම වේ. " ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහි ද ? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

(04) (අ) කණ්ඩායම් හා සමූහ අතර වෙනස්කම් දක්වා විවිධාකාරයේ වැඩ සමූහයන් මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ආ) "කණ්ඩායමක් තුළ ඇති ඉහළ සාමූහිකත්වය, කණ්ඩායමේ ඉහළ ඵලදායීත්වය කෙරෙහි බලපානු ලබයි " ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහි ද ? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

(05) (අ) සංජානන ක්‍රියාවලිය දක්වමින් සංජානනය සඳහා බලපානු ලබන සාධක විස්තාරණය කරන්න.

(ලකුණු 08)

(ආ) විරූම්ගේ අභිප්‍රේරණය සම්බන්ධ අපේක්ෂා න්‍යාය නූතන ලෝකයේ උදාහරණ යොදාගනිමින් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

(06) පහත දැක්වෙන මාතෘකා අතරින් හතරක් සම්බන්ධයෙන් පමණක් කෙටි සටහන් ලියන්න.

(අ) ප්‍රභාමණ්ඩල ඵලය.

(ආ) සමාජ ඉගෙනුම් න්‍යාය

(ඇ) ක්ලමතය හා සංවිධාන කාර්‍යසාධනය

(ඉ) බලය හා දේශපාලනය

(ඊ) කැරිස්මා නායකත්වය

(මුළු ලකුණු 05x04=20)